# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2043/9 – 2017 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා – 2017.10.30

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/19/04/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2029/3 දරන හා 2017.07.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් බදුල්ල, මහියංගන පාර, අංක 97/1 හි පදිංචි ඩබ්ලිව්. වී. ඩී. හරිස්චන්ද්‍ර මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 01, ආදිපාද වීදිය, අංක 11 හි පිහිටි හලාවත වැවිලි සමාගම අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3485 දරන හා 2016.07.21 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩබ්ලිව්. වී. ඩී. හරිස්චන්ද්‍ර මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3485 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2018.07.24 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

*1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත*
*බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම*

ලිපිනය : ඩබ්ලිව්. වී. ඩී. හරිස්චන්ද්‍ර,
97/1, මහියංගන පාර,
බදුල්ල.
දිනය : 2017.09.16

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2017.07.24 දිනැති අංක 2029/03 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්ද වූ ද ඩබ්ලිව්. වී. ඩී. හරිස්චන්ද්‍ර සහ හලාවත වැවිලි සමාගම සමග බැඳී සිටින්නා වූ ද 2016.07.21 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන :

*පිටපත:* හලාවත වැවිලි සමාගම,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

11 - 714

---

මගේ අංකය: IR/10/51/2012.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2021/48 දරන හා 2017.06.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් පිළියන්දල, දම්පේ පල්ලිය වත්ත, අංක 162/1 හි පදිංචි එම්. එන්. ප්‍රනාන්දු මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 03, ගාලුපාර, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411 හි පිහිටි ලංකා විදුලි (පුද්) සමාගම අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3551 දරන හා 2017.01.17 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ලංකා විදුලි (පුද්) සමාගම වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3551 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2018.06.02 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**''අ'' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

***1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත***
*සාමූහික ගිවිසුමක්/බේරුම්කරුවෙකුගේ*
*කම්කරු විනිශ්චය අධිකාරයක නිරවුල් කිරීමක්*
*තීරණයක් / ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම*

සී/ස ලංකා විදුලි (පුද්) සමාගම,
411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
කොළඹ 03.
2017.07.24

කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2017 ජුනි මස 02 වන සිකුරාද අංක 2021/48 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්ද වූ ද පිළියන්දල, දම්පේ පල්ලිය වත්ත, නො. 162/1 හි පදිංචි එම්. එන්. ප්‍රනාන්දු මයා සහ කොළඹ 03, ගාලු පාර, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411 ලංකා විදුලි (පුද්) සමාගම බැඳී සිටින්නා වූ ද ඒ 3551 ප්‍රදනයේ 2017.01.17 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

………………………………
සාමාන්‍යාධිකාරී

*පිටපත:* එම්. එන්. ප්‍රනාන්දු,
නො. 162/1, දම්පේ පල්ලිය වත්ත,
පිළියන්දල

11 - 715

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.